# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,715 - 2011 ජූලි මස 15 වැනි සිකුරාදා - 2011.07.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | -- |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | -- |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | -- |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | -- |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | -- |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | 478 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | -- |
| රජයේ නිවේදන ... ... ... | 478 |
| මිල පාලන දැන්වීම් ... ... ... | -- |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | -- |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | -- |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | -- |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 480 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | -- |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | -- |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳ ව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳ ව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳ ව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2011 ජූලි මස 22 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2011 ජූලි මස 08 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

477- B 080241—3,350 (2011/07)
A1–

# වෙනත් පත් කිරීම් ආදිය

2011 අංක 336

1978 අංක 02 දරන අධිකරණ සංවිධාන පනතේ 45(3) වැනි වගන්තියෙන් මා වෙත පවරා ඇති බලතල ප්‍රකාරව අධිකරණ අමාත්‍ය රවුෆ් හකීම් වන මම, පහත උපලේඛනයේ සඳහන් නීතිඥ මහත්ම මහත්මීන් අදාළ අධිකරණ කොට්ඨාස සඳහා සාමදාන විනිශ්චයකාරවරුන් සහ නිල නොලත් මහෙස්ත්‍රාත්වරුන් වශයෙන් පත් කරමි.

රවුෆ් හකීම්,
අධිකරණ අමාත්‍ය.

2011 මැයි මස 30 වැනි දින,
කොළඹ 12,
අධිකරණ අමාත්‍යාංශයේ දී ය.

උපලේඛනය

| අනු. අංකය | නම | ලිපිනය | අධිකරණ කලාපය |
|---|---|---|---|
| 01 | නීතිඥ කිත්සිරි බණ්ඩාර මනතුංග මහතා | අංක 506/4ඒ, කොස්වත්ත පාර, අග්ගොන, අංගොඩ | කොළඹ |
| 02 | නීතිඥ සමරකෝන් මුදියන්සේලාගේ ජායානන්ද සමරකෝන් මහතා | අංක 180, නිලම්මහර පාර, මහරගම | අවිස්සාවේල්ල |
| 03 | නීතිඥ කොළඹගේ ගුණරත්න මහතා | අංක 254, ජායා මාවත, දැදිගමුව | අවිස්සාවේල්ල |
| 04 | නීතිඥ වඩුගෙදර මුදියන්සේලාගේ පර්සි ලක්ෂ්මන් වඩුගෙදර මහතා | බෝවත්ත, බිංගිරිය | කුලියාපිටිය |
| 05 | නීතිඥ ඉන්ද්‍රජිත් සුකිත ඒකනායක අමරසේකර මහතා | දොඩම්කුඹුරවත්ත, අලව්ව | කුරුණෑගල |
| 06 | නීතිඥ ජයසිංහ මුදියන්සේලාගේ පද්මා ලාලනී ජයවර්ධන මහත්මිය | අංක එච් 5/3, ඇන්ඩර්සන් මහල් නිවාස, නාරාහේන්පිට | කොළඹ |

07-294

# රජයේ නිවේදන

## පෙරියකට්ටු ශාන්ත අන්තෝනි දේවමැදුරේ උත්සවය - 2011

ඉහත සඳහන් උත්සවය 2011 ජූලි මස 29 වැනි දින ආරම්භ කර 2011 අගෝස්තු මස 07 වැනි දින අවසන් කරන බව මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

02. මේ පිළිබඳව 1949.05.27 වැනි දින අංක 9978 හා 1950.05.26 වැනි දින අංක 10105 දරන *ගැසට් පත්‍රවල* පළමු නිවේදනවලට පොදු මහජනතාවගේ අවධානය යොමු කරවනු ලැබේ.

03. ප්‍රසිද්ධියට පත් කරන ලද මෙම නිත්‍ය රෙගුලාසි මෙම උත්සවය පැවැත්වෙන කාලසීමාව තුළ වලංගු වනවා ඇත.

පී. එස්. එම්. චාර්ල්ස්,
දිස්ත්‍රික් ලේකම්/දිසාපති,
වවුනියාව.

2011 ජූනි මස 24 වැනි දින,
වවුනියාව දිසාපති කාර්යාලයේ දී ය.

07-325

## වන්දනා ගමන් ආඥාපනත

දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ දෙවිනුවර ශ්‍රී විෂ්ණු මහා දේවාලයේ 2011 වාර්ෂික ආගමික උත්සවය 2011 අගෝස්තු මස 07 වැනි ඉරිදා සිට 2011 අගෝස්තු මස 21 වැනි ඉරිදා දින දක්වා පවත්වනු ලබන බව වන්දනා ගමන් ආඥාපනතේ (175 වැනි පරිච්ඡේදය) රෙගුලාසිවල 10 වැනි වගන්තිය අනුව 1959 නොවැම්බර් මස 20 වැනි දින නිකුත් කරන ලද අංක 11959 දරන ලංකාණ්ඩුවේ *ගැසට් පත්‍රය* යටතේ මෙයින් දන්වමි.

ඩබ්. කේ. කේ. අතුකෝරල,
දිස්ත්‍රික් ලේකම්/දිසාපති,
මාතර.

2011 ජුනි මස 20 වැනි දින,
මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී ය.

07-299

එල්. ඩී. බී. 277/40.

**(188 වැනි අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනත**

19 වැනි වගන්තිය යටතේ වූ නියමය

(188 වැනි අධිකාරය වූ) පුරාවස්තු ආඥාපනතේ කාර්ය සඳහා මේ දැන්වීමෙහි උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන ස්මාරක, ආරක්ෂක ස්මාරකයන් බවට ප්‍රකාශයට පත් කරමින් එම ආඥාපනතේ 18 වැනි වගන්තිය යටතේ නියමයක් කිරීමට අදහස් කරන බව ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍ය ජගත්සිරි මානෙල් බාලසූරිය වන මා විසින් මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඉහත කී නියමය කිරීමට එරෙහිව යම් විරෝධතා ඇත්නම්, එම විරෝධතා 2011.07.29 වැනි දින හෝ එදිනට පෙර පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්වරයා, කොළඹ යන ලිපිනය වෙත එවිය යුතුය. එවැනි සෑම විරෝධතාවයක්ම ලිඛිතව ඉදිරිපත් කළ යුතු අතර, එම විරෝධතාව/විරෝධතා ඉදිරිපත් කරනු ලබන්නේ යම් හේතු මත ද, එම හේතු පිළිබඳ ප්‍රකාශයක් ද එහි අන්තර්ගත විය යුතු ය.

ආචාර්ය ජගත්සිරි මානෙල් බාලසූරිය,
ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍ය.

2011 ජුනි මස 28 වැනි දින,
කොළඹ දී ය.

**උපලේඛනය**

***ආරක්ෂිත ස්මාරක ලෙස ප්‍රකාශයට පත්කරනු ලබන ස්මාරක ලේඛනය***

*මධ්‍යම පළාත*

01. මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, රත්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක ඒ/376, වෙලන්ගහවත්ත ග්‍රාමනිලධාරි වසමේ පිහිටි වෙලන්ගහ වත්ත ශ්‍රී ධම්මජෝත්‍යාරාම විහාර භූමියේ ඇති ධර්ම ශාලාව සහිත ටැම්පිට ප්‍රතිමා ගෘහය.

02. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දොරමඩලාව ග්‍රාම නිලධාරි වසමේ පිහිටි දොරමඩලාව රජමහා විහාර භූමියේ ඇති කටාරම් සහිත ලෙන් විහාරය, පිහිටි ගලේ ඇති පියගැට පේළි දෙක සහ සණ්ඨාර කුළුන.

03. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩපළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගම්පොල ග්‍රාම නිලධාරි වසමේ පිහිටි ගම්පොල නගරයේ නුවර වීදියේ ඇති කදිරේෂන් කෝවිල.

04. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දෙහිපාගොඩ නැගෙනහිර ග්‍රාම නිලධාරි වසමේ පිහිටි දෙහිපාගොඩ අග්‍රබෝධි විහාර භූමියේ ඇති ප්‍රතිමා ගෘහ දෙක, චෛත්‍යය, පියගැට පෙළ දෙක සහ සඳකඩ පහන් දෙක.

05. මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බඹරගහදෙණිය ග්‍රාම නිලධාරි වසමේ පිහිටි සඳසිරි දුනුවිල ලෙන් විහාර භූමියේ ඇති ලෙන් ආවාස ගෘහය සහ ස්වාභාවික ගල්ලෙන.

*බස්නාහිර පළාත*

06. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුරුඳුවත්ත ග්‍රාම නිලධාරි වසමේ පිහිටි කේම්බ්‍රිජ් පෙදෙසෙහි (ක්‍රෙසන්ට් කොටේජ්) අංක 17 දරන ස්ථානයේ ඇති පැරණි නිවස.

07. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, රත්මලාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රත්මලාන නගරයේ පිහිටා ඇති අන්ධ විද්‍යාලයීය භූමියට අයත් පැරණි දෙමහල් ගොඩනැගිල්ල.

08. බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොටුව ග්‍රාම නිලධාරි වසමේ පිහිටි කොළඹ 01, යෝක් වීදිය, අංක 40 දරන ස්ථානයේ ඇති කාගිල්ස් සමාගමට අයත් ගොඩනැගිල්ල.

09. බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, බේරුවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 732 මැටියමුල්ල ග්‍රාම නිලධාරි වසමේ පිහිටි පයාගල ස්වර්ණාරාම විහාර භූමියේ ඇති පැරණි ප්‍රතිමා ගෘහය.

10. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 336/ඒ, කැන්දලන්ද ග්‍රාම නිලධාරි වසමේ පිහිටි තෝරපිටිය ග්‍රාමයේ වෙහෙරහේන නමින් හඳුන්වන ඉඩමේ ඇති චෛත්‍ය ගොඩැල්ල, ගල්බිඳුම් ස්ථානය, ගල් පඩිපෙළ සහ ප්‍රාග් ඓතිහාසික සාධක සහිත ගුහා ආවරණය.

11. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 4/ඒ, මාලදෙණිය ග්‍රාම නිලධාරි වසමේ පිහිටි මාලදෙණිය ශෛලකාන්තාරාම පුරාණ විහාර භූමියේ ඇති ගිරිලිපිය, පැරණි ස්තූප ගොඩැල්ල, පියගැටපේළි, ලෙන් විහාරය, කටාරම් සහ ලෙන්ලිපි සහිත සියලුම ලෙන්.

*සබරගමුව පළාත*

12. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අම්බුළුගල ග්‍රාම නිලධාරි වසමේ පිහිටි අම්බුළුගල ශ්‍රී දන්තපාය රජමහා විහාර භූමියේ ඇති දෙමහල් ටැම්පිට ප්‍රතිමා ගෘහය.

13. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 23 බී, කැප්පෙටිපොළ ග්‍රාම නිලධාරි වසමේ පිහිටි කැප්පෙටිපොළ ටැම්පිට විහාරය.

14. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, අරණායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 46 ගොඩිගමුව ග්‍රාම නිලධාරි වසමේ පිහිටි ඉහළ ගොඩිගමුව ගල්ලෙනේ වත්ත (පන්සලේවත්ත) නමින් හඳුන්වන ඉඩමේ ඇති කටාරම් කෙටූ ලෙන.

15. සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඉලුක්ගොඩ ග්‍රාම නිලධාරි වසමේ පිහිටි ඉලුක්ගොඩ ශෛලමස්තකාරාම විහාර භූමියේ ඇති පැරණි ප්‍රතිමා ගෘහය සහ ධර්ම ශාලාව.

*නැගෙනහිර පළාත*

16. නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, පදවි ශ්‍රී පුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 31එෆ්, පරණ මැදවච්චිය ග්‍රාම නිලධාරි වසමේ පිහිටි පරණ මැදවච්චිය ග්‍රාමයේ රංමඩුව

රජමහා විහාර භූමියේ ඇති ප්‍රතිමා ගෘහය සහිත ගොඩනැගිලි නටබුන් සංකීර්ණය.

17. නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, කඩවත් සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 243 පී කන්නියා ග්‍රාම නිලධාරී වසමේ පිහිටි කන්නියා ග්‍රාමයේ ඇති උණුදිය ළිං 7, ඒ ආසන්නයේ ඇති චෛත්‍ය ගොඩැල්ල සහ නටබුන් ගොඩනැගිල්ල.

18. නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පුල්මුඩේ ග්‍රාම නිලධාරී වසමේ පිහිටි පුල්මුඩේ වෙරළ තීරයට යාබද අරිසිමල කඳුවැටියේ පිහිටා ඇති පුරාවිද්‍යාත්මක නටබුන්.

*වයඹ පළාත*

19. වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, හලාවත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හලාවත නගර මධ්‍යයේ පිහිටා ඇති සීගිරි නමින් හඳුන්වන නිවස හෙවත් කොරයා වලව්ව.

20. වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, හලාවත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 569ඩී නැගෙනහිර මානුවන්ගම, ග්‍රාම නිලධාරී වසමේ පිහිටි තොඩුච්චිවටවන ග්‍රාමයේ දැඳුරුඔය නිම්නයේ ඇති දාගැබ් ගොඩැල්ල සහ ටෙරාකොටා මැටි බඳුන් සහිත පුරාවිද්‍යා ස්ථානය.

07-398

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - රත්නපුර ශාඛාව

1990 අංක 4 දරන බැංකු මඟින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ජා ගොඩගේ පාලිත රත්නපාල සහ කොස්වත්තගේ අරුණි රේණුකා ප්‍රසන්ති රත්නපාල.

2011 ජනවාරි මස 06 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :-

රත්නපුර ප්‍රසිද්ධ නොතාරිස් එස්. එච්. කොස්ගොඩගේ විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි නමට ලියන ලද්දාවූ ද 2005.03.09 දිනැති සහ අංක 471 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ජාගොඩගේ පාලිත රත්නපාල සහ කොස්වත්තගේ අරුණි රේණුකා ප්‍රසන්ති රත්නපාල යන අය ණයකරුවන් හැටියට ද, පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් විසිඅටලක්ෂ අනූහත්දහස් තුන්සිය හතලිස්තුනයි ශත පනස්හය (රු. 28,97,343.56)ක මුදලක් 2010.11.23 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 28,97,343.56 ක මුදලට 2010.11.24 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩු කොට එකී අංක 471 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත උකස්කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මෙමගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය මහ නගර සභා සීමාවේ, නුවරඑළියෙහි පිහිටි "යුනික් වීව් පාරේ", වරිපනම් අංක 88/1 හි "යුනික් වීව් එස්ටේට්" නමැති ඉඩමට බලයලත් මානක ඊ. ප්‍රනාන්දු විසින් ලියා සහතික කරන ලද 2004.02.19 දිනැති පිඹුරු අංක 1625ඒ හි ලොට් 1ට මායිම්, උතුරට : ටොරින්ටන් ක්‍රීඩා පිටියෙන් ද, නැගෙනහිරට: පාරෙන් සහ ලොට් ආර් 14න් ද, දකුණට : ටොරින්ටන් ක්‍රීඩා පිටියෙන් සහ ලොට් 22 සහ 130න් ද සහ බස්නාහිරට : ටොරින්ටන් ක්‍රීඩා පිටියෙන් මායිම් වූ රූඩ් තුනයි, පර්චස් නමයයි දශම හතයි පහ (අ. 0, රූ. 3, පර්. 9.75)ක් විශාල ඉඩම ගොඩනැගිල්ල සහ සියලු දේත් සමග වේ.

ඉහත කී අංක 471 දරන උකස් බැඳුම්කරයේ දෙවැනි උපලේඛනයේ වැඩිදුරටත් විස්තර කර ඇති මාර්ග අයිතීන් ද සමග වේ.

මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රාණි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණි (නීති).
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

07-429/1

---

## හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - රත්නපුර ශාඛාව

1990 අංක 4 දරන බැංකු මඟින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ජාගොඩගේ පාලිත රත්නපාල.

2011 ජනවාරි මස 06 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :-

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. සී. ජයවර්ධන විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි. නමට ලියන ලද්දාවූ ද, 2003.12.30 දිනැති සහ අංක 1956 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ජාගොඩගේ පාලිත රත්නපාල යන අය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් විසිහත්ලක්ෂ හැත්තෑහයදහස් පන්සිය අසූදෙකයි ශත තිස්පහ (රු. 27,76,582.35) ක මුදලක් 2010.11.23 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 27,76,582.35ක මුදලට 2010.11.24 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදන්තරව

ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩු කොට එකී අංක 1956 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත උකස් කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්‍ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනියි.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාවේ, කොට්ඨාස අංක 37, කොල්ලුපිටියේ, ධර්මපාල මාවතේ, ආර්. ඒ. ඩි මෙල් මාවතේ, වරිපනම් අංක 250/4/11 "ලිබර්ටි ප්ලාසා" ගොඩනැගිල්ලට බලයලත් මානක පී. සින්නතම්බි විසින් පිළියෙල කරන ලද 1993.02.04 දිනැති අංක 3878 දරන සහාධිපත්‍ය පිඹුර ප්‍රකාරව බෙදා වෙන්කළ සහාධිපත්‍ය ඒකක ජේ 411 වන උතුරට : ජේ 410 දරන ඒකකය සහ මෙම ඒකකය වෙන්වන බිත්තියේ මැදින් ද, නැගෙනහිරට : සීඊ 66 බී විවෘත පෙදෙසෙහි සහ ඒයු 03ට ඉහලින් වූ විවෘත පෙදෙසින් මෙම ඒකකය වෙන් වන බිත්තියේ මැදින් ද, දකුණට : සීඊ 92 සහ සීඊ66බී විවෘත පෙදෙස් සහ මෙම ඒකකය වෙන්වන බිත්තියේ මැදින් ද, බස්නාහිරට : සීඊ 73 විවෘත පෙදෙස සහ සීඊ92 සහ මෙම ඒකකය වෙන් වන බිත්තියේ මැදින් ද, උඩින් ජේ 311 ඒකකයට ඉහලින් පිහිටි මෙම ඒකකයේ කොන්ක්‍රීට් පොළවේ මැදින් ද, පතුලින් : ඉහලින් පිහිටි ජේ 511 ඒකකයේ කොන්ක්‍රීට් පොළොවේ මැදින් ද, මායිම් වූ ඉහත කී අංක 3878 දරන සහාධිපත්‍ය පිඹුර ප්‍රකාර වර්ග මීටර් එකසිය හතලිස් අටයි දශම හතක් (148.70 වර්ග මීටර්) එනම් වර්ග අඩි එක්දහස් හයසියයක් (1600 වර්ග අඩි) විශාලත්වය ඇති බිම් ප්‍රමාණයක් වන මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සහාධිපත්‍ය ඒ 38/59 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී උකස් ඔප්පුවේ දෙවන උපලේඛනයේ විස්තර කර ඇති පොදු අංගයන්ට නොබෙදූ 164ක කොටස් අයිතියක් සමග, සහ

බලයලත් මිනින්දෝරු පී. සින්නතම්බි විසින් සකස් කරන ලද ඉහත කී අංක 3898 සහ 1993.02.04 දිනැති පිඹුරේ සීඊ 92 ලෙස දැක්වෙන එකී ජේ 411 දරන ඒකකය සඳහා වූ පොදු පිවිසුම් ප්‍රදේශය ද සමග වේ.

මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රාණි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණි (නීති).
අධ්‍යක්‍ෂ මණ්ඩලයේ ලේකම්.

07-429/2

---

## හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - පිළියන්දල ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

ජයසූරිය ආරච්චිගේ රංජිත් පෙරේරා, මහන්ත මුදියන්සේලාගේ ශිරෝමි නිලූෆර් ප්‍රේමචන්ද්‍ර.

2011 මැයි මස 26 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්‍ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :-

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් බී. ඩී. ටී. ධර්මතිලක විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි නමට ලියන ලද්දාවූ ද, 2006.05.04 වැනි දින අංක 1522 සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එම්. ඩී. ඒ. කේ. අදිකාරි විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දාවූ ද, 2010.10.01 වැනි දින අංක 933 දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ජයසූරිය ආරච්චිගේ රංජිත් පෙරේරා හා මහන්ත මුදියන්සේලාගේ ශිරෝමි නිලූෆර් ප්‍රේමචන්ද්‍ර ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරයන් යටතේ රුපියල් පනස්තුන්ලක්‍ෂ අනූපන්දහස් පන්සිය අසූනවයයි ශත හැට (රු. 53,95,589.60) ක මුදලක් 2011.02.14 වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 53,95,589.60 ක මුදලට 2011.02.15 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිවූර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන් ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 1522 සහ 933 දරන උකස් බැඳුම්කරයන් මගින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත උකස් කොට ඇත්තාවූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු පී. මුතුකුමාරණ මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්‍ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, දෙහිවල - ගල්කිස්ස නගර සභා සීමාව තුළ රත්මලාන දකුණෙහි පිහිටි ශ්‍රී ධර්මාරාම පාර, වරිපනම් අංක 74/12 දරන "මාදන්ගහවත්ත" සහ "වැල්ලබොඩවත්ත" හෙවත් "ඇලබොඩවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. අයි. අයි. ප්‍රනාන්දු විසින් මැන සාදන ලද අංක 1785 ඒ සහ 1997 ජනවාරි මස 25 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද "ලොට් ඒ 16" ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට: දංදෙනිය වලව්වත්ත හෙවත් වෙරළබොඩ මහවත්තෙන් ද, නැගෙනහිරට: ලොට් 17න් ද, දකුණට : පාරෙන් ද සහ ලොට් ඒ 9න් ද සහ බස්නාහිරට : දුම්රිය මාර්ගයට වෙන් කරන ලද කොටසකින් ද, මායිම් වූ එකී අංක 1785ඒ දරන පිඹුර ප්‍රකාරව පර්චස් අට (අ. 0, රූ. 0, පර්. 8) ක විශාල ඉඩම තුළ පිහිටි ගොඩනැගිලි සහ අනෙකුත් සියලුම දේත් සමග ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 2271/36 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, දෙහිවල - ගල්කිස්ස නගර සභා සීමාව තුළ රත්මලාන දකුණෙහි පිහිටි ශ්‍රී ධර්මාරාම පාර, වරිපනම් අංක 74/12 ඒ දරන "මාදන්ගහවත්ත" සහ "වැල්ලබොඩවත්ත" හෙවත් ඇලබොඩවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. අයි. අයි. ප්‍රනාන්දු විසින් මැන සාදන ලද අංක 1785බී සහ 1997 ජනවාරි මස 25 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන්කරන ලද "ලොට් ඒ 17" ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට: දංදෙනිය වලව්වත්ත හෙවත් වෙරළබොඩ මහවත්තෙන් ද, නැගෙනහිරට: පිඹුරු අංක 1566 ට අයත් ලොට් ඒ7 න් ද, දකුණට : පාරෙන් ද සහ බස්නාහිරට: ලොට් ඒ16න් මායිම් වූ එකී අංක 1785බී දරන පිඹුර ප්‍රකාරව පර්චස් අට (අ. 0, රූ. 0, පර්. 8) ක විශාල ඉඩම තුළ පිහිටි ගොඩනැගිලි සහ අනෙකුත් සියලුම දේත් සමග ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් 2271/37 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

බලයලත් මිනින්දෝරු ආර්. ඩබ්. ප්‍රනාන්දු විසින් මැන සාදන ලද පිඹුරු අංක 2399ට අයත් ඉහත කී අංක 1522 සහ 933 දරන උකස්කරයන්හි වැඩිදුරටත් විස්තර කරන අඩි 20ක් පළලැති පාරක් සඳහා වෙන්කර ඇති මාර්ග අයිතිය ද සමග වේ.

අධ්‍යක් ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රාණි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණි (නීති).
මාණ්ඩලික ලේකම්.

07-429/3

---

## හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - කිරුළපන ශාඛාව

1990 අංක 4 දරන බැංකු මඟින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අධ්‍යක් ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

කරුණාගොඩ මුදලිගේ පියසේන සහ ඉන්ද්‍රානි රම්‍යලතා උඩුවනගේ.

2011 මාර්තු මස 10 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක් ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :-

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එම්. ඩී. ඒ. කේ. අදිකාරි විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි නමට ලියන ලද්දාවූ ද, 2009.11.27 දිනැති සහ අංක 589 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම කරුණාගොඩ මුදලිගේ පියසේන සහ ඉන්ද්‍රානි රම්‍යලතා උඩුවනගේ යන අයවළුන් ණයකරුවන් හැටියට, පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හැත්තෑඑක්ලක් ෂ හතලිස්එක්දහස් එකසිය දෙකයි ශත තිස්නමය (රු. 71,41,102.39)ක මුදලක් 2010.11.24 දින වැනි විට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 71,41,102.39ක මුදලට 2010.11.25 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළියද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩු කොට එකී අංක 589 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත උකස් කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු පී. මුතුකුමාරණ ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මඟින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක් ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ, සහ මහ නගර සභා සීමාව තුළ කිරුළපන, වසම් අංක 44 කිරුළපන පිහිටි, ශ්‍රී සිද්ධාර්ථ පැසේජ් හි වරිපනම් අංක 33/4 දරන දෙල්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මානක ජේ. ඒ. ඩබ්. කාවාලෝ විසින් මැන සාදන ලද 2001.12.05 දින සහ අංක 2188 දරන පිඹුරෙන් බෙදා වෙන් කළ ලොට් 7702 දරන ඉඩම් කොටස වන උතුරට : ලොට් 7530 සහ ලොට් 7532න් ද, නැගෙනහිරට : ලොට් 7703න් ද, දකුණට : ලොට් 7704 සහ 7705න් ද සහ බස්නාහිරට : ලොට් 7706 සහ 4059න් ද මායිම් වූ එකී අංක 2188 දරන පිඹුර ප්‍රකාරව පර්චස් පහයි දශම තුනයි අට (අ. 0, රූ. 0, පර්. 5.38) ක් විශාල ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියළුදේත් වේ. මෙම ඉඩම කොළඹ දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කිරි 159/229/230 යටතේ ලියාපදිංචි වී ඇත.

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ සහ මහ නගර සභා සීමාව තුළ කිරුළපන, වසම් අංක 44 කිරුළපන පිහිටි ශ්‍රී සිද්ධාර්ථ පැසේජ් හි වරිපනම් අංක 33/1 දරන දෙල්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මානක ජේ. ඒ. ඩබ්. කාවාලෝ විසින් මැන සාදන ලද 2001.12.05 දින සහ අංක 2188 දරන පිඹුරෙන් බෙදා වෙන් කළ ලොට් 7705 දරන ඉඩම් කොටස වන උතුරට : ලොට් 7702න් ද, නැගෙනහිරට : ලොට් 7703 සහ 7704න් ද, දකුණට : ලොට් 7704 සහ 7706න් ද සහ බස්නාහිරට : ලොට් 7706 සහ 4059න් ද මායිම් වූ එකී අංක 2188 දරන පිඹුර ප්‍රකාරව පර්චස් දෙකයි දශම නමයයි දෙක (අ. 0, රූ. 0, පර්. 2.92) ක් විශාල ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියලුදේත් වේ. මෙම ඉඩම කොළඹ දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කිරි159/233 යටතේ ලියාපදිංචි වී ඇත.

එකී අංක 589 දරන උකස් බැඳුම්කරයේ දෙවන උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති මාර්ග අයිතීන් ද සමග වේ.

මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රාණි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණි (නීති),
අධ්‍යක් ෂ මණ්ඩලයේ ලේකම්.

07-429/4

---

## හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - මීගමුව ශාඛාව

1990 අංක 4 දරන බැංකු මඟින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අධ්‍යක් ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

අහමඩ් ජමල්ඩීන් මරික්කාර් මොහොමඩ් අබෝ යූසුෆ් සහ ෆාතිමා අස්වියා යූසුෆ් විවාහයට පෙර ෆරීඩ්.

2011 මැයි මස 26 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක් ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී :-

මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් ජී. එම්. එම්. ප්‍රනාන්දු විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි නමට ලියන ලද්දාවූ ද 2008.02.08 දිනැති සහ අංක 2325 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම අහමඩ් ජමල්ඩීන් මරික්කාර් මොහොමඩ් අබෝ යූසුෆ් සහ ෆාතිමා අස්වියා යූසුෆ් විවාහයට පෙර ෆරීඩ් යන අයවළුන් ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හැටහයලක් ෂ පනස්දෙදහස් පන්සිය හතලිස්එකයි ශත අසූහත (රු. 66,52,541.87)ක මුදලක් 2011.02.28වැනි දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. ට අයවිය යුතුව සහ

ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 66,52,541.87ක මුදලට 2010.03.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩු කොට එකී අංක 2325 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත උකස් කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූද දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු පී. මුතුකුමාරණ ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනි.

### පළමුවැනි උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව නගර සභා සීමාවේ, කොස්ගහවත්ත, මාදන්ගහවත්ත, නාවලදිය *හෙවත්* මාදන්ගහවත්ත, බක්මීගහකුඹුර *හෙවත්* බක්මීගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. එල්. කෘෘස් දාබ්රේරා විසින් පිළියෙල කරන ලද 1964.12.01 දිනැති අංක 7241ඒ දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් අංක 5ඒ නමැති ඉඩම් කොටස වන උතුරට : ලොට් 1බී සහ 5ඩී (අඩි 10ක් පළල පාරක් සඳහා වෙන් කරන ලද කොටස), නැගෙනහිරට : ලොට් 5බී සහ ජේ. ඩී. ජුලියස් අප්පුහාමිට අයිති ඉඩමෙන් ද, දකුණට : ලොට් 5සී වලින් ද සහ බස්නාහිරට : ශාන්ත ලාසරස් පාරෙන් ද මායිම් වූ පර්චස් තිස්අටයි දශම තුන (අ. 0, රූ. 0, පර්. 38.3) ක් විශාල ඉඩම ගොඩනැගිලි සහ සියලුදේත් සමග වන මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ245/10 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත විස්තර කරන ලද ඉඩම බලයලත් මිනින්දෝරු ඩී. පී. විමලසේන විසින් 2007.12.08 දින පිඹුරු අංක 6684 දරන කොටස මෑතක දී කරන ලද මැනුමකට අනුව මෙසේ විස්තර වේ :

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, (මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසයේ) මීගමුව නගර සභා සීමාවේ, මහහුණුපිටිය, ශාන්ත ලාසරස් පාරේ, අංක 87, කොස්ගහවත්ත, මාදන්ගහවත්ත, නාවලදිය *හෙවත්* මාදන්ගහවත්ත, බක්මීගහකුඹුර *හෙවත්* බක්මීගහවත්ත නමැති ඉඩමේ අංක 6684 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් අංක 1 නමැති ඉඩම් කොටස වන උතුරට : අඩි 12ක් පළල පාරෙන් ද, නැගෙනහිරට : පිඹුරු අංක 7241ඒ හි ලොට් 5බී සහ ඒ. සී. නිලාම් රාමලන්ට අයිති ඉඩමෙන් ද, දකුණට : ෆැටිමා අස්වියාට අයිති ඉඩමෙන් ද සහ බස්නාහිරට : ශාන්ත ලාසරස් පාරෙන් ද මායිම් වූ පර්චස් තිස්හයයි දශම තුනයි බින්දුව (අ. 0, රූ. 0, පර්. 36.30) ක් විශාල ඉඩම වේ.

### දෙවැනි උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව නගර සභා සීමාවේ, කොස්ගහවත්ත, මාදන්ගහවත්ත, නාවලදිය *හෙවත්* මාදන්ගහවත්ත, බක්මීගහකුඹුර *හෙවත්* බක්මීගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. එල්. කෘෘස් දාබ්රේරා විසින් පිළියෙල කරන ලද 1964.12.01 දිනැති අංක 7241ඒ දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් අංක 5ඩී (පාර සඳහා වෙන් කරන ලද කොටස) නමැති ඉඩම් කොටස වන උතුරට: ලොට් 1බී වලින් ද, නැගෙනහිරට : ඇලෙන් ද, දකුණට : ලොට් 5ඒ සහ 5බී වලින් ද සහ බස්නාහිරට : ශාන්ත ලාසරස් පාරෙන් ද මායිම් වූ පර්චස් හතරයි දශම නමය (අ. 0, රූ. 0, පර්. 4.9) ක් විශාල ඉඩම වන මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 245/103 යටතේ ලියාපදිංචි කර ඇත.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව නගර සභා සීමාවේ, කොස්ගහවත්ත, මාදන්ගහවත්ත, නාවලදිය *හෙවත්* මාදන්ගහවත්ත, බක්මීගහකුඹුර *හෙවත්* බක්මීගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. එල්. කෘෘස් දාබ්රේරා විසින් පිළියෙල කරන ලද 1964.12.01 දිනැති අංක 7241 ඒ දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් අංක 1බී (පාර සඳහා වෙන් කරන ලද කොටස) නමැති ඉඩම් කොටස වන උතුරට: ලොට් 1ඒ වලින් ද, නැගෙනහිරට : ඇලෙන් ද, දකුණට : පාර සඳහා වෙන් කරන ලද කොටස (අඩි 5 පළල) ලොට් 5ඩී වලින් ද සහ බස්නාහිරට : ශාන්ත ලාසරස් පාරෙන් ද මායිම් වූ පර්චස් හතරයි දශම නමය (අ. 0, රූ. 0, පර්. 4.9) ක් විශාල ඉඩම වන මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 245/104 යටතේ ලියාපදිංචි කර ඇත.

මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රාණි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති).
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

07-429/5

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.